# පානදුර බාලිකා මහා විද්‍යාලය - පානදුර

## වාර අවසාන පරීක්ෂණය 2018 නොවැම්බර්

## 13 ශ්‍රේණිය

**ඉන්දියා ඉතිහාසය** **25A-S-1**

ඉන්දියා ඉතිහාසය(ඈත අතීතයේ සිට ක්‍රි. ව. 1206 දක්වා)
සැලකිය යුතු යි.
 * සියලු ම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
 * නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.

ප්‍රශ්න අංක 1-10 තෙක් ප්‍රශ්න වලට නම් පහ බැගින් දී ඇත. ඒවා අතුරෙන් එකක් පමණක් කවර හෝ හේතුවක් මත අනෙක් නම් මත නොගැළපේ. එම නොගැළපෙන නම කුමක්දැ'යි හඳුනාගෙන එහි අංකය වරහන තුළ ලියන්න.

**01** (01) දේවකෘතයෝනි (02) ඔරිස්සා (03) සප්තසින්ධු (04) දේව නිර්මිතදේශ (05) පන්ජාබ් (..........)

**02** (01) භරත (02) පුරු (03) අලීන (04) යදු (05) තුර්වාශ (..........)

**03** (01) පුරෝහිත (02) සේනානි (03) විෂ්පති (04) ග්‍රාමණී (05) පරුමක (..........)

**04** (01) රාජගෘහ (02) හරප්පා (03) රබිගාර්හි (04) චන්හුදාරෝ (05) ධොලවීර (..........)

**05** (01) පැතිබැමි යුගලය (02) ඉහළ ආවරණය (03) මනුබිල (04) පහන් කුලුනු (05) ජලපිවිසුම් කවුළු(..........)

**06** (01) වරුණ (02) මිත්‍ර (03) සාවිත්‍රි (04) වායු (05) උෂා (..........)

**07** (01) ඉගෙනීම (02) ඉගැන්වීම (03) යාග කිරීම (04) දන්දීම (05) සත්ත්ව පාලනය(..........)

**08** (01) ඛේමා (02) උත්පලවණ්නා (03) චෙල්ලනා (04) මල්ලිකා (05) විදේහ වාසවී (..........)

**09** (01) මහේන්ද්‍ර (02) ව්‍යාඝ්‍රරාජ (03) උග්‍රසේන (04) විෂ්ණුගෝප (05) සටෝද්කච (..........)

**10** (01) දේවගුප්ත (02) මදුරෙයිකොණ්ඩ (03) දේවරාජ (04) දේවශ්‍රී (05) පරමභට්ටාරක (..........)

අංක 11-15 තෙක් ප්‍රශ්න වල පද යුගල 5 බැගින් දී ඇත. ඒවා අතුරෙන් එක යුගලයක පද එකිනෙකට නොගැළපේ. ඒ නොගැළපෙන යුගලය කුමක්දැ'යි හඳුනාගෙන ඊට අදාළ අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.

**11** (01) රට - රට්ටලදු
(02) විෂ් - විෂ්පති
(03) ජන - රාජන්
(04) ගම - ගම්පති
(05) පවුල - කුලපා (..........)

**12** (01) කපිලවස්තු - ශාක්‍යයෝ
(02) වේශාලි - ලිච්ඡවි
(03) මිථිලාව - විදේහයෝ
(04) කේසපුත්තය - මෝරිය
(05) රාමගාමය - කෝලියයෝ (..........)

13 (01) අශෝක - අනුරුද්ධ
(02) අනුරුද්ධ - උදායින්
(03) උදායින් - අජාසත්
(04) අජාසත් - බිම්බිසාර
(05) බිම්බිසාර - භට්ටිය (..........)

14 (01) සුවණ්ණභූමි - මහාරක්ඛිත හිමි
(02) කාශ්මීර-ගන්ධාරය - මජ්ඣන්තික හිමි
(03) මහීස රට - මහාදේව හිමි
(04) වනවාසදේශය - රක්ඛිත හිමි
(05) අපරන්තක දේශය - ධම්මරක්ඛිත හිමි (..........)

15 (01) අලහබාද් ප්‍රශස්තිය - හරිශේන
(02) මුද්‍රාරාක්ෂස - වසුබන්ධු
(03) කතාසරිත්සාගරය - සෝමදේව
(04) කුමාරසම්භව - කාලිදාස
(05) දශකුමාරචරිත - දණ්ඩින් (..........)

අංක 16 සිට 20 තෙක් එක් එක් ප්‍රශ්නයන්හි නාම/ප්‍රකාශන/ දිනවකවානු සමූහයක් X හා Y තීරු වල දී ඇත. Y තීරුවේ ඇති නාම/ප්‍රකාශන/ දිනවකවානු X තීරුවේ ඇති ඒවා හා කිසියම් ආකාරයකට ගැළපේ. එහෙත් ඒවා දක්වා ඇත්තේ ගැළපෙන අනුපිළිවෙළට නොවේ. Y තීරුව X තීරුව සමග ගැළපෙන අනුපිළිවෙළ සකස් කළ විට පහත ඇති සංයෝග පහෙන් එකක් නිවැරදිය. එම නිවැරදි සංයෝගයට අයත් අංකය වරහන තුළ ලියන්න.

16

| X | Y |
|---|---|
| (01) ක්‍රිෂ්ණ නදිය | A වයඹ සිට ගිනිකොණට |
| (02) නර්මදා නදිය | B නැගෙනහිර සිට බටහිරට |
| (03) සෝණ නදිය | C දකුණේ සිට උතුරට |
| (04) ගෝග්‍රා නදිය | D බටහිර සිට නැගෙනහිරට |
| (05) ගංගා නදිය | E උතුරේ සිට දකුණට |

01. ACBDE 02. BDCAE 03. CAEBD 04. DBCEA 05. ECBAD (..........)

17

| X | Y |
|---|---|
| (01) නීතිය | A ධර්මන් |
| (02) දඬුවම | B බලි |
| (03) බදු | C දණ්ඩ |
| (04) සමූහාණ්ඩු | D ගණපති |
| (05) ජංගම බලකොටු | E පූර්වරිස්ණු |

01. ACBDE 02. BDCAE 03. CAEBD 04. DBCEA 05. ECBAD (..........)

18

| X | Y |
|---|---|
| (01) ගර්භ පරිදාන කර්මන් | A නම් තැබීම |
| (02) නාමකරණ කර්මන් | B ඉඳුල් කටගෑම |
| (03) චූඩාකර්මන් | C දරුවෙකු පිළිසිඳ ගැනීම සම්බන්ධ ක්‍රියා |
| (04) අන්නප්‍රාසාන කර්මන් | D විවාහය |
| (05) චතුර්හි කර්මන් | E කෙස් කැපීම |

01. ACBDE 02. BDCAE 03. CAEBD 04. DBCEA 05. ECBAD (..........)

**19** X | Y

| X | Y |
|---|---|
| (01) පුරෝහිත | A ඡත්‍ර දරන්නා |
| (02) සේනානි | B සේනාවේ පාලකයා |
| (03) සංග්‍රහිත්‍රි | C භාණ්ඩාගාරික |
| (04) අක්ෂවාෂ | D රජුගේ උපදේශක |
| (05) ක්ෂත්‍රි | E සූදු පාලක |

01. ACBDE 02. BDCAE 03. CAEBD 04. DBCEA 05. ECBAD (..........)

**20**

| X | Y |
|---|---|
| (01) චතුර්වේද | A දුක්ඛ, සමුදය, නිරෝධ, මාර්ග |
| (02) චතුර් වර්ණ | B ඍග්, යජුර්, සාම, අතර්වන් |
| (03) චතුර් ආශ්‍රම | C බ්‍රහ්මචාරී, ගෘහස්ථ, වානප්‍රස්ථ, සන්‍යාසි |
| (04) චතුර් සත්‍යය | D බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය, වෛශ්‍ය, ක්ෂුද්‍ර |
| (05) චතුර් උපායමාර්ග | E සාම, දාන, භේද, දණ්ඩ |

01. ACBDE 02. BDCAE 03. CAEBD 04. DBCEA 05. ECBAD (..........)

අංක 21 සිට 25 තෙක් සෑම ප්‍රශ්නයකට ම එක් මාතෘකාවක් යටතේ කරුණු පහ බැගින් සපයා ඇත. එම කරුණු අතුරෙන් එකක් අදාළ මාතෘකාවට නොගැළපේ. එය තෝරා ඊට අදාළ අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.

**21** ඉන්දීය සාහිත්‍ය මූලාශ්‍රය

(01) බොහෝ ප්‍රමාණයක් ඇත
(02) නමුත් විශ්වසනීයත්වයෙන් හීන ය
(03) එසේ වුව ද රාමායන වීර කාව්‍යයට සම්බන්ධ සියලු ම සිද්ධි පුරාවිද්‍යාත්මකව සනාථ වී තිබේ
(04) බොහොමයක් සාහිත්‍ය මූලාශ්‍රයන්ට දේවකතාමය හෝ දේව විශ්වාසය හා බැඳුණු මූලයක් තිබේ
(05) පුරාණ ග්‍රන්ථ 18ක් ඇතත් ඉන් විශ්වසනීය ඉතිහාස මූලාශ්‍ර ලෙස ගතහැක්කේ දෙකක් තරම් සුළු ප්‍රමාණයකි (..........)

**22** ඍග් වෛදික ගෝත්‍ර

(01) ගෝත්‍රයේ නායකයා රාජන් නම් විය
(02) ගෝත්‍රයේ විශාලත්වය මත රාජ්‍යයේ ධනවත්කම තීරණය විය
(03) රාජන්වරු සාම්රාට් හෙවත් "විශ්වෂ්‍ය භුවනශ්‍ය රාජා" වැනි නම් වලින් හඳුන්වා ඇත
(04) ප්‍රබල දුබල හා වනචාරී ගෝත්‍ර වශයෙන් ගෝත්‍ර වර්ග 3ක් තිබිණැ'යි පර්යේෂකයෝ සඳහන් කරති
(05) ගෝත්‍ර පාලනය රාජාණ්ඩු ක්‍රමයේ පාලනයක් වුවත් එසේ නොවූ පාලන ක්‍රම ද පැවතුණි (..........)

**23** හරප්පා සභ්‍යත්වයේ ආර්ථිකය

(01) කෘෂිකර්මය මත පදනම් විය
(02) විදෙස් වෙළඳාම පමණක් සිදු වූ බවට සාධක තිබේ
(03) පේෂ වඩු කුඹල් ආදී විවිධ කර්මාන්තයන් ද පැවතී ඇත
(04) සත්ත්ව පාලනය යටතේ එළුවා හා කුකුළා ද ඇති කළ බවට සාධක තිබේ
(05) වාණිජ බෝගයක් ලෙස කපු වගාකර තිබේ (..........)

**24** අශෝක ධර්මය

(01) බුදු දහම පදනම් කරගත් දහමකි
(02) එය සපුරා ම බුදුදහම නොවේ
(03) යහපත් හැසිරීම හා විනීත භාවය වැනි දේ එහි මූලිකාංග අතර තිබේ
(04) අශෝක ධර්මය වැළඳ ගැනීම මෞර්ය අධිරාජ්‍යයේ සියලු වැසියන්ට අනිවාර්ය කර තිබුණි
(05) ධර්ම ප්‍රචාරය සඳහා ධර්ම මහාමාත්‍රවරු පත්කර තිබුණි (..........)

e-thaksalawa The National e-learning Portal for The General Education

**25** දෙවන චන්ද්‍රගුප්ත රජුට පසු යුගය

(01) පළමු කුමාරගුප්ත බලයට පත්විය

(02) හිතරි ගිරි ලිපියේ මේ යුගය පිළිබඳ තොරතුරු යම් ප්‍රමාණයක් තිබේ

(03) කුමාර ගුප්තයන් මේ යුගයේ දී ගුප්ත බලවර්ධනයට අදාල කිසිදු යුධමය ක්‍රියාමාර්ගයක් ගෙන නැත

(04) හූන ආක්‍රමණ එල්ල වීම ප්‍රබල ලෙස සිදු විය

(05) මෙකල ග්‍රීක ආක්‍රමණිකයින් ද වයඹදිග ඉන්දියාව ආක්‍රමණය කළහ (..........)

**අංක 26 සිට 30 තෙක් එක් එක් ප්‍රශ්නයට දක්වා ඇති(A),(B),(C) හා (D) යන ප්‍රතිචාර අතරින් එකක් හෝ කිහිපයක් හෝ නිවැරදිය.නිවැරදි ප්‍රතිචාරය හෝ ප්‍රතිචාර තෝරා,**
**(A)සහ(B) පමණක් නිවැරදි නම්............. 1 ද**
**(B)සහ(C) පමණක් නිවැරදි නම්............. 2 ද**
**(C)සහ(D) පමණක් නිවැරදි නම්............. 3 ද**
**(A)සහ(C) පමණක් නිවැරදි නම්............. 4 ද**

ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් නිවැරදි නම්............. 5 ද වරහන් තුළ ලියන්න.

| උපදෙස් සම්පිණ්ඩණය | | | | |
|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 |
| (A)සහ(B) පමණක් නිවැරදිය. | (B)සහ(C) පමණක් නිවැරදිය. | (C)සහ(D) පමණක් නිවැරදිය. | (A)සහ(C) පමණක් නිවැරදිය. | ප්‍රතිචාර එකක් හෝ දෙකකට වැඩි සංඛ්‍යාවක් නිවැරදිය. |

**26** ඍග් වෛදික යුගයේ රාජන් වරුන් සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශ/ප්‍රකාශය නිවැරදි වේ ද?

(A) ප්‍රබල ගෝත්‍ර අභිෂේක උත්සව පවා පවත්වා ඇත

(B) සිය යටත් වැසියාට ආදර්ශයක් වෙමින් රජු ජීවත් වූයේ ඉතා කුඩා නිවසක ය

(C) ඇතැම් රජවරුන් පිළිබඳව ප්‍රශස්ති ගීතිකා පවා තිබී ඇත

(D) මේ යුගයේ රාජ්‍යත්වය උරුම වූයේ පරපුරෙනි (..........)

**27** ඉන්දියානු වේද සාහිත්‍යය සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශ/ප්‍රකාශය නිවැරදි වේ ද?

(A) ඍග් වේදයෙන් හෙළි වන යුගය ඍග් වෛදික යුගය නම් වේ

(B) සෙසු වේද ග්‍රන්ථ පශ්චාත් වෛදික යුගයේ සංග්‍රහ වී ඇත

(C) වේද ග්‍රන්ථ යනු ඉතා විශ්වසනීය ඓතිහාසික මූලාශ්‍ර විශේෂයක් වශයෙන් ඉතිහාසඥයන්ගේ ඇගයුමට ලක්ව ඇත

(D) ආයුර්වේදය චතුර්වේදයෙන් එකකි (..........)

**28** බින්දුසාර රජු සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශ/ප්‍රකාශය නිවැරදි වේ ද?

(A) කෞටිල්‍යගේ උපදෙස් මත කටයුතු කළේ යැයි තිබ්බත ලේඛක තාරානාථ පවසයි

(B) සංස්කෘත ලේඛන වල ඔහුගේ නම අමිත්‍රඝාත නමින් දක්වා තිබේ

(C) මේ රජු නගර 16ක බලය බිඳ දැමුවේ යැයි ටිබෙට් ලේඛන වල සඳහන් වේ

(D) ඩිමෝකස් යනු මේ රජ දවස මෞර්ය රාජසභාවේ සිටි ග්‍රීක තානාපතිවරයා ය (..........)

**29** අලහබාද් ප්‍රශස්තිය සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශ/ප්‍රකාශය නිවැරදි වේ ද?

(A) සමුද්‍රගුප්ත අධිරාජයා සම්බන්ධයෙන් වන ප්‍රශස්තියකි

(B) මෙය අශෝක රජුගේ ටැම් ලිපියක අනෙක් පස කරවා තිබේ

(C) ප්‍රයාග ප්‍රශස්තිය යනු ද මේ ප්‍රශස්තිය ම ය

(D) කාලිදාස මෙහි පිටපත් රචකයා ය (..........)

**30** දෙවන චන්ද්‍රගුප්ත රජු සම්බන්ධයෙන් පහත සඳහන් කවර ප්‍රකාශ/ප්‍රකාශය නිවැරදි වේ ද?

(A) සමුද්‍රගුප්තයන්ගේ පදනම මත ගුප්ත අධිරාජ්‍යය ගොඩනැංවූයේ මේ රජු බව පිළිගැනෙයි

(B) ඔහුව නැපෝලියන්ට සම කිරීම පිළිබඳව ඉන්දියානුවෝ විරුද්ධ වූහ

(C) මාල්වා ජයග්‍රහණයෙන් පසු හේ ''වික්‍රමාදිත්‍ය'' යන විරුදය භාවිතකරන්නට පටන්ගත්තේ ය

(D) ඍජුව ම යුද්ධ වලට සහභාගී වීම නිසා ඔහුගේ සිරුරේ සෑම තැන ම තුවාල කැළැල් වූ බව සඳහන් ය (..........)

ප්‍රශ්න අංක 31-35 දක්වා වඩාත් නිවැරදි පිළිතුර තෝරා එහි අංකය තිත් ඉරි මත ලියන්න.

**31** ඍග් වෛදික ගෝත්‍ර අතරින් වැඩිහිටියන්ගෙන් පමණක් සමන්විත වූ ආයතනය වූයේ

(01) සමිති

(02) සභා

(03) සමූහාණ්ඩු

(04) රාජාණ්ඩු

(05) විෂ් (..........)

**32** පාලනයේ පහසුව පිණිස වෛදික රජවරු තම ජනයා කොටස් පහකට බෙදා පාලනය කළහ. එම කොටස් පහ හැඳින්වූ නාමය වූයේ

(01) පංජබ්

(02) පංචජනඃ

(03) පන්සිළු

(04) පංචවර්ණ

(05) පංචරාජ (..........)

**33** 1498 වර්ෂයේ දී බටහිර ජාතිකයෙකුගේ සම්ප්‍රාප්තිය සමග ප්‍රකටභාවයට පත් ඉන්දීය වරායකි

(01) ගෝව

(02) කොචින්

(03) කැලිකට්

(04) බොම්බේ

(05) විශාකපට්න (..........)

**34** මෞර්ය පාලන ක්‍රමය තුළ අධිරාජ්‍යය බෙදා තිබූ කොටස් හතරට අයත් නොවන්නේ

(01) ගන්ධාර

(02) රායිචූර්

(03) කාලිංග

(04) අවන්ති

(05) ස්වර්ණගිරි (..........)

**35** කාතියවාරයේ ගුප්ත සාමන්ත පර්ණදත්තයන් යොදවා ජලාශයක් ප්‍රතිසංස්කරණය කරවූයේ

(01) ස්කන්ධගුප්ත රජු

(02) බුදගුප්ත රජු

(03) කුමාරගුප්ත රජු

(04) පුරුගුප්ත රජු

(05) නරසිංහ ගුප්ත රජු (..........)

36 සිට 40 තෙක් ප්‍රශ්න යටතේ ප්‍රකාශ 2 බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්නය යටතේ දී ඇති ප්‍රකාශ යුගලයට හොඳින් ගැළපෙනුයේ පහත වගුවේ දැක්වෙන 1, 2, 3, 4 සහ 5 යන කවර ප්‍රකාශ යුගලය දැයි තෝරා අදාළ අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.

| | පළමු ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| 1 | නිවැරදිය | නිවැරදිය |
| 2 | නිවැරදිය | වැරදිය |
| 3 | වැරදිය | නිවැරදිය |
| 4 | වැරදිය | වැරදිය |
| 5 | නිවැරදිය | නිවැරදි වන අතර පළමුවැන්න මැනවින් පහදා දෙයි |

| | පළමු ප්‍රකාශය | දෙවන ප්‍රකාශය | (..........) |
|---|---|---|---|
| 36 | බෝසස්කෝයි ශිලාලේඛනයේ ක්‍රි. පූ. 1400 දී පමණ ඇති වූ ගිවිසුමක තොරතුරු තිබේ. | බෝසස්කෝයි ශිලාලේඛනයෙන් හෙළි වන්නේ බබිලි ලියුමා හා මත්ති ආසා අතර ඇති වූ ගිවිසුම යි. | (..........) |
| 37 | අජ, ශිෂ්රු හා යක්ෂ යනු ආර්ය ගෝත්‍ර වේ. | අජ ශිෂ්රු හා යක්ෂ ගෝත්‍ර එක් වී භරත ගෝත්‍රයේ සුදාස් රජු පරාජය කළහ. | (..........) |
| 38 | කෝසලයේ මුල්කාලීන අගනුවර වූයේ සාකේත හෙවත් අයෝධ්‍යාව යි. | අයෝධ්‍යාවේ රාම උපන් බව හින්දූහු විශ්වාස කරති. | (..........) |
| 39 | යුද්ධයකින් තොරව කාසි රාජ්‍යය අල්ලා ගැනීම බිම්බිසාර රජුගේ අපේක්ෂාව විය | අජාසත් රජු යුද්ධයකින් කාසි රාජ්‍යය අල්ලා ගත්තේ ය. | (..........) |
| 40 | නහපාන රජු සාතවාහනයින් හා ගැටී තම බලය වර්ධනය කරගත්තේ ය. | ගෞතමීපුත්‍ර රජු ද නහපාන අභියස පරාජය විය. | (..........) |

The National e-learning Strategy, The General Education